ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය **කරනු නොලැබේ.**

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය 2023 වර්ෂයේ අවසන්වීමේදී දෙපාර්තමේන්තුව වෙත පවරන ලද එකතුව රු.2,296,821,546 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාළ අයිතම නිවැරදිව හඳුනාගෙන CIGAS වැඩසටහන මඟින් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	Escam ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති අවසන් වාර්තාවේ දක්වා ඇති වත්කම් වටිනාකම රු.2,296,821,546 ක් වුවත් එය සිගාස් වැඩ සටහනට ඇතුළත් කිරීමට නම් විධිමත් පරිදි භාර ගැනීම් සිදුවිය යුතුය. භාර දෙන ලද වත්කම් වෙන්කර ඉදිරියේදි ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.	නිවැරදිව ගිණුම් තැබීම් සිදු කිරීමට නිලධාරීන් වගවිය යුතුවේ.
(ආ)	විදුලි වැට උපකරණ සොරා ගැනීම් හා එම උපකරණවලට හානි සිදුවීම්වලට අදාළ අලාභ රු.2,358,410 ක් 2024 වර්ෂය තුළ පොත්වලින් කපා හැරීමට තීරණය කර හානි පාඩු ලේඛනයෙන් කපාහැර තිබුණද, එම වටිනාකම් ජංගම නොවන වත්කම්වල විදුලිවැට උපකරණවලින් ඉවත් කර නොතිබීමෙන් ජංගම නොවන වත්කම් රු.2,358,410 ක් වැඩියෙන් දැක්විණි.	සිගාස් වැඩ සටහනෙහි ජංගම නොවන වත්කම් වලින් අලාභ හා හානි සිදු වූ වත්කම්වල වටිනාකම ඉවත් කල යුතු වුවත් එම වටිනාකම ඉවත් නොකිරීම මත එම ශේෂය වැඩියෙන් පෙන්නුම් කරයි. එය 2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.	නිවැරදිව ගිණුම් තැබීම් සිදු කිරීමට නිලධාරීන් වගවිය යුතුවේ.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 04 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.1,194,901,394ක් හෙවත් සියයට 58 සිට සියයට 73 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුනි.	- බහු කාර්යය සහායකයින් බඳවා ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද පත්වීම් ප්‍රදානය නොකිරීම. විදේශ ගමන් පාලනය හා විදේශ ගමන් වියදම් සීමා කිරීම. නිල ඇඳුම් ලබා ගැනීම සඳහා 2024 වර්ෂයට අදාළ භාණ්ඩ නිසි පරිදි සැපයීම් සිදු නොවීම සහ අපේක්ෂා කල වියදම් පැන නොගැනීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය.	ප්‍රායෝගික කරුණු පිළිබඳව සලකා බලා මුදල් රෙගුලාසි 50(11) ප්‍රකාරව ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතුවේ.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(2) වගන්තිය	-	ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සිය අස්ථිත්වයේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ සමාලෝචනය ලිඛිතව සිදු කර එහි පිටපතක්	අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව සමාලෝචනය සිදු කරන ලද බවට වූ මගේ අංක ME/WFRCD/FIN/ F1/Final.St 2024 හා	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ සමාලෝචනය ලිඛිතව

			විගණකාධිපති වෙත ලබා දිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.	2025.04.24 දිනැති ලිපිය විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී.	සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද	506,059	මියගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 05 ඉක්ම වූ රු.506,059 ක ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	මියගිය සේවකයාගේ සේවා කාලය වසර 10 කට අඩු වන අතර, මරණ පාරිතෝෂිකය හිමි නොවන බැවින් අදාළ ණය මුදල ගෙවීමට කටයුතු කරන මෙන් වැන්දඹුවට ලිඛිතව දැනුම් දී ඇත. වැඩ තහනම් කළ එක් අයෙකුගේ සහ සේවය හැරගිය එක් අයෙකුගේ ණය ශේෂය සම්බන්ධයෙන් නීති උපදෙස් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. සේවය අත්හැර ගිය තවත් සේවකයෙකුගේ ණය මුදල අයකර ගැනීම සඳහා කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර. ඔහු විදේශගතව ඇති බැවින් වර්තමාන ලිපිනය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. සේවය අත්හැර ගිය තවත් සේවකයෙකුගේ ණය මුදල අයකර ගැනීම	ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව කටයුතු කර රජයට අය විය යුතු මුදල් කඩිනමින් අය කර ගත යුතුය.

				සඳහා වත්කම් තහවුරුවක් ලබා ගැනීමේදී ඔහු සතුව වත්කම් නොමැති බව අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත.	
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 570 සහ 571(2)	1,579,802	තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ සියලුම තැන්පතු ඉකුත් තැන්පතු ලෙස සලකා රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වුවද, වසර 2 ඉක්මවූ රු.1,543,326 ක හා වසර 04 ඉක්ම වූ රු.36,476 තැන්පතු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	වසර 02 ඉක්මවූ 1,543,326.95 ක මුදල් තැන්පත් කල ආයතනයෙන් ඉල්ලීම් ඉදිරිපත් නොවුනහොත් රජයේ ආදායමට යොමු කිරීමට කටයුතු කරනු ඇත. රු.36,476.11 ක මුදල රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඇ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) වගන්තිය	45,885,481	අනුරාධපුර, නැගෙනහිර, වව්නියාව, ත්‍රිකුණාමලය සහ මධ්‍යම කලාප කාර්යාලයන්හි පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කිරීමකින් තොරව අතිකාල හා නිවාඩු දින වැටුප් පිළිවෙලින් රු.13,506,093, රු.11,971,448, රු.1,845,650, රු.2,940,239 සහ රු.15,622,051 ක් වශයෙන් එකතුව රු.45,885,481 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.	ඇඟිලි සලකුණු යන්ත්‍ර නොමැති කාර්යාලයන්හි පැමිණීමේ හා පිටවීමේ ලේඛනයේ වේලාවන් පදනම් කරගනිමින් ගෙවීම් කටයුතු සිදුකර ඇත.	2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ)	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 06 ඡේදය		අලාභයේ වටිනාකම සඳහන් නොවූ වාහන අනතුරු 09 ක් හානි පාඩු ලේඛනය තුළ ඇතුළත් කර තිබුණද, ඒවා මූල්‍ය ප්‍රකාශනවල (ඇමුණුම 01) පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.	වාහන අනතුරක් වාර්තා වී ඇති බැවින් හානි හා පාඩු ලේඛනයේ ඇතුලත් කරන ලදී. අදාළ වාර්තා මඟින් අලාභය සම්බන්ධයෙන් තොරතුරු ලද පසු මූල්‍ය වටිනාකම සටහන් කිරීමට කටයුතු කරනු ඇත	මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතුය

3.3 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විගණිත දිනයවූ 2024 දෙසැම්බර් 23 දිනට විල්පත්තු ජාතික උද්‍යානයේ මෝටර් ග්‍රේඩර යන්ත්‍රයේ මයිලෝමීටරය අනුව යන්ත්‍ර පැය 1494ක් වුවද, දෛනික ධාවන සටහනේ යන්ත්‍ර පැය 2010 ක් දක්වා පැය 516 ක් වෙනස් කර ඉන්ධන ලීටර් 5160 ක් සඳහා රු.1,475,760 ක මුදලක් අවභාවිතා කර තිබුණි.	මයිලෝමීටරයේ විගණනය මගින් පෙන්වා දී ඇති වෙනස්කම් දක්නට ලැබුණු බවත් ඒ සම්බන්ධයෙන් හා ඉන්ධන භාවිතය සම්බන්ධයෙන් ඉදිරියේදී විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන බවත් අනුරාධපුර කළාප භාර සහකාර අධ්‍යක්ෂ විසින් දන්වා ඇත.	විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇති කිරීමට පියවර ගත යුතුය.
(ආ)	ධාවන සටහන් අනුව ඉහත යන්ත්‍රය 2024 සැප්තැම්බර් 08 සහ 13 යන දිනයන්හිදී දිනකට යන්ත්‍ර පැය 50 බැගින් පැය 100 ක් ධාවනය කර ඇති බවත්, ඒ වෙනුවෙන් ඉන්ධන ලීටර් 1000 ක් ලබා ගෙන තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව දිනකට වැඩ කළ යන්ත්‍ර පැය ගණන සාමාන්‍ය පැයට පරිවර්තනය කළ විට දිනකට පැය 37.5 ක් වශයෙන් අසාමාන්‍ය අගයක් ගෙන තිබීමෙන් ධාවන සටහන් සාවද්‍ය ලෙස ලිවීමෙන් ඉන්ධන හෝ යන්ත්‍ර අවභාවිතයක් සිදු කර තිබුණි.	මයිලෝමීටරයේ විගණනය මගින් පෙන්වා දී ඇති වෙනස්කම් දක්නට ලැබුණු බවත් ඒ සම්බන්ධයෙන් හා ඉන්ධන භාවිතය සම්බන්ධයෙන් ඉදිරියේදී විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන බවත් අනුරාධපුර කළාප භාර සහකාර අධ්‍යක්ෂ විසින් දන්වා ඇත.	විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇති කිරීමට පියවර ගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන	2024 වර්ෂයේ ඒකාබද්ධ අරමුදලේ මූල්‍ය ප්‍රගතිය රු.මි.253.9 කි. එය ප්‍රතිශතයක් වශයෙන් ලබා දී තිබූ ප්‍රතිපාදන මුදල වන රු.මි.292 න් 86.9%	සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු කිරීමට පියවර ගත යුතුය.

54.05 ක් වූ කාර්යයන් 63 ක් සම්බන්ධයෙන් කිසිදු භෞතික ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.	කි. එබැවින් මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන නැත්තේ රු.මි. 38.1 ක් පමණක් වේ. සැලසුම් කල ඇතැම් කාර්යයන් ක්ෂේත්‍රයේ පැවති ගැටළුකාරී තත්ත්වයන් නිසා අවලංගු කර ඇති අතර, ඒ වෙනුවට වෙනත් කාර්යයන් සිදු කර ඇත.	

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 23.71 ක් වූ කාර්යයන් 62 ක භෞතික ප්‍රගතිය සියයට 3 සිට සියයට 30 අතර අවම මට්ටමක පැවතුණි.	2024 වර්ෂයේ ඒකාබද්ධ අරමුදලේ මූල්‍ය ප්‍රගතිය රු.මි. 253.9 කි. එය ප්‍රතිශතයක් වශයෙන් ලබා දී තිබූ ප්‍රතිපාදන මුදල වන රු.මි.292 න් 86.9% කි. එබැවින් මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන නැත්තේ රු.මි. 38.1 ක් පමණක් වේ. ඇතැම් සැලසුම් කල කාර්යයන් ක්ෂේත්‍රයේ පැවති ගැටළුකාරී තත්ත්වයන් නිසා අවලංගු කර ඇති අතර, ඒ වෙනුවට වෙනත් කාර්යයන් සිදු කර ඇත.	සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු කිරීමට පියවර ගත යුතුය.

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මින්නේරිය වනෝද්‍යානය සහ එහි පරිසර පද්ධතිය හා ජීවීන් පිළිබඳ සංචාරකයන්ට අවබෝධයක් ලබාදීමේ අරමුණින් උද්‍යාන පිවිසුමේ තනා ඇති කෞතුකාගාරය නිසි නඩත්තුවක් හා නවීකරණයක් කර නොතිබීම නිසා අපවිත්‍ර වී	සංචාරක තොරතුරු මධ්‍යස්ථානයෙහි වහළයේ අබලන් තත්ත්වය හේතුවෙන් වැසි දිනවලදී උපකරණවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත තැන් වලට විතැන් කර ඇත. මෙම ගොඩනැගිල්ලෙහි වහලය අලුත්වැඩියාව 2025 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත.	අලුත්වැඩියාවන් සිදුකර සංචාරක ආකර්ශනය වැඩිකර ගැනීමට පියවර ගත යුතුය.

	තිබීමෙන් එම කෞතුකාගාරය ප්‍රදර්ශනය කිරීමට සුදුසු මට්ටමේ නොතිබුණි.		
(ආ)	කවුඩුල්ල වනෝද්‍යානය තුල පිහිටි මැණික්සොරොව්ව සංචාරක බංගලාවේ නවීකරණ කටයුතු රු.3,555,313 ක වියදමකින් 2024 අප්‍රේල් මාසයේ නිම කර තිබුණද, 2025 අප්‍රේල් 04 දක්වා සංචාරකයන් සඳහා විවෘත කර නොතිබුණි.	දීර්ඝ කාලයක සිට සංචාරක නිවාසය වසා තැබීම හේතුවෙන් එවකට සිටි බංගලා භාරකරු වෙනත් සංචාරක නිවාසයකට මාරු කර ඇති අතර වාර්ෂික ස්ථාන මාරු වලින් බංගලා භාරකරුවකු ලැබුනු පසු සංචාරක නිවාසය විවෘත කිරීමට සැලසුම් කර ඇත.	වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට පුහුණු සැසි පැවැත්වීම මූලික අරමුණ කර ගනිමින් ඉදිකර තිබූ රිටිගල පුහුණු මධ්‍යස්ථානය තුළ 2024 වර්ෂයේදී පුහුණු සැසි 05 ක් පමණක් පවත්වා තිබුණි**.**	සම්පත්දායකයින් සඳහා නවාතැන් පහසුකම් සැපයීමේදී සහ අන්තර් ජාල පහසුකම් ලබා ගැනීමේදී මතුවූ ගැටළු හේතුවෙන් 2024 වර්ෂය තුළදී පැවැත්වීමට සැලසුම් කර තිබූ ඇතැම් පුහුණු වැඩසටහන් වෙනත් ස්ථානයන්හි පැවැත්වීමට සිදු වූ අතර, 2025 වර්ෂයේදී පුහුණු වැඩ සටහන් කිහිපයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.	වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

4.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
හෝර්ටන් තැන්න ජාතික උද්‍යානයට අදාළව 2005 වර්ෂයේ පිළියෙල කර තිබූ කළමණාකරණ සැලැස්මේ ඇතුළත් ජාතික උද්‍යානයේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රවේශපත්‍ර කවුළු පට්ටිපොළ දක්වා පහළ ස්ථානයක් වෙත	• පට්ටිපොළ ප්‍රවේශ බලපත්‍ර කවුළුව පට්ටිපොළ නගරයට ආසන්න ස්ථානයක් වෙත රැගෙන ඒම සඳහා ඉදිරියේ දී කටයුතු කිරීමට අපේක්ෂා කරමි. • හෝර්ටන්තැන්න ජාතික	දේශීය සහ විදේශීය සංචාරකයින් සඳහා අවශ්‍ය පහසුකම් ඇති කිරීමට කටයුතු කළ යුතුය

ගෙන ඒම, පැමිණෙන සංචාරකයින් සඳහා වඩාත් ගුණාත්මක සංචාරක පහසුකම් සැපයීම සඳහා විවේකී ස්ථාන ඇති කිරීම, දේශීය මෙන්ම විදේශීය සංචාරකයින් සඳහා යෝග්‍ය සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම, සංචාරකයින් සඳහා ආපනශාලාවක් ඇති කිරීම, සංචාරකයින් ගමන් ගන්නා මාර්ගවල සුදුසු ස්ථානයන්හි විවේක ගැනීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම යන කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි.	උද්‍යානයේ ආපනශාලාව ආසන්නයේ ඇති සනීපාරක්ෂක පහසුකම් හැර අන් සියලු පොදු සනීපාරක්ෂක පහසුකම් ස්ථාපිත කරන ලද්දේ කළමනාකරණ සැලසුමේ දැක්වෙන නිර්දේශ අනුව ය. • සංචාරකයින් ගමන් ගන්නා ස්වාභාවික මංපෙතේ සනීපාරක්ෂක පහසුකම් ස්ථාපිත කරන ලද නමුත් ඔවුන්ට ආසන පැනවීමක් පමණක් සිදු කර නොමැත.

4.5 ප්‍රසම්පාදනයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 සහ 4.3.2 ඡේද ප්‍රකාරව සියලුම සම්බන්ධිත පිරිවැය ඇතුළත් කරමින් මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවද 2024 වර්ෂයේ නිල ඇඳුම් උපාංග මිලදී ගැනීමේ කාර්යය සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි.	නිල ඇඳුම් උපාංග මිලදී ගැනීම සඳහා පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුන ද මෙය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සහ ප්‍රසම්පාදන සැලැස්මට ඇස්තමේන්තු අගයක් ලෙස ඇතුලත් කර අනුමැතිය ලබා තිබුණි. මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතුය.

4.6 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය මඟින් දෙපාර්තමේන්තුව වෙත පවරන ලද එකතුව රු.2,296,821,546 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාළ අයිතම නිවැරදිව හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.	Escam ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති වත්කම් ස්ථාවර වත්කම් ලෙස ඇතුළත් කිරීමට නම් විධිමත් පරිදි නිශ්චිත ලේඛනයකින් භාරදීම් හා භාර ගැනීම් සිදුවිය යුතුය. ඒ අනුව ඉදිරියේදී නිවැරදි කරන බව කාරුණිකව දැනුම් දෙමි.	අදාළ වත්කම් නිවැරදිව හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය.

4.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ අරමුණු අතර රක්ෂිත ප්‍රදේශ තුළ පරිසර පද්ධතීන් සංරක්ෂණය කරන අතරම පාරිසරික සංචාරක කටයුතු සඳහා ඇති අවස්ථාවන් භාවිතා කිරීමේ පහසුකම් ඇති කළ යුතු වීම ඇතුළත්ව තිබුණ ද දෙපාර්තමේන්තුව සතු ජාතික උද්‍යානවල පැවති පහත සඳහන් අඩුපාඩු හේතුවෙන් එම අරමුණු ඉටු වී නොතිබුණි		.
	I. හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය		
	උද්‍යානය තුළ පවතින 'වන නිවහන' සංචාරක නිවාසය ඉතා අබලන් හා අපිරිසිදු තත්වයේ පවතින අතර සනීපාරක්ෂක පහසුකම් ද නොමැති වීම හේතුවෙන් 2023 හා 2024 වර්ෂවල මෙම සංචාරක නිවාසය වෙන් කිරීම මසකට දින 01 සිට දින 12 දක්වා ඉතා අවම මට්ටමක පැවතිණි. එමෙන්ම උද්‍යානය තුළ පිහිටි සේවක නිල නිවාස වසර ගණනාවක් තිස්සේ නිසි අළුත්වැඩියාවකට ලක් කර නොතිබීම නිසා වනජීවී නිලධාරීන් හට සිය රාජකාරී තෘප්තිමත් භාවයකින් සිදුකරගෙන යෑමට අපහසු වී තිබුණි.	උද්‍යාන මූලස්ථානය ආශ්‍රිතව වැසිකිළි 13 ක් ඇති අතර, පිරිසිදු කිරිමේ සේවාවක් කොන්ත්‍රාත් පදනමින් සිදුකෙරේ. තව ද ආපදා නිසා හානියට පත්වන වැසිකිළි පහසුකම් කඩිනමින් අලුත්වැඩියා කිරීම ද ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කරනු ලැබේ. සංචාරක නිවාසය ප්‍රධාන අලුත්වැඩියාවකට යටත් කිරීමට අපේක්ෂා කරමින් මේ වන විට ප්‍රසම්පාදන කටයුතු නිමකර කොන්ත්‍රාත් පිරිනැමීම සිදුකර ඇත.	සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කළ යුතු වේ
	II. හොරගොල්ල ජාතික උද්‍යානය		
	වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ 1992 හදිසි ඇමතුම් අංකයට ලැබෙන සත්ව අනතුරු සම්බන්ධ තොරතුරු මත පදනම්ව සතුන් මුදවා ගැනීම සහ	හොරගොල්ල ජාතික උද්‍යාන භාරකරුගේ ඉල්ලීම අනුව කොටි මිනිස් ගැටුම කළමනාකරණයට අවශ්‍ය උපකරණ ලබා දීමට	අනතුරට ලක්වන සතුන් මුදවා ගැනීමට හා ප්‍රතිකාර කිරීමට අවශ්‍ය පහසුකම්

සතුන්ට ප්‍රතිකාර කිරීම සිදු කරනු ලැබුව ද හොරගොල්ල ජාතික උද්‍යාන බල ප්‍රදේශයට අයත් ප්‍රදේශයන්හී පවතින කොටි මිනිස් ගැටුම හේතුවෙන් අනතුරට පත්වන කොටීන් මුදවා ගැනීම සහ ප්‍රතිකාර කිරීමට අවශ්‍ය උපකරණ කාර්යාල සතුව නොතිබුණි.	ඉදිරියේදී කටයුතු කරමි	සලසා දීමට කටයුතු කල යුතු වේ
III. මින්නේරිය හා කවුඩුල්ල ජාතික උද්‍යානය		
මින්නේරිය වන උද්‍යානය ආරම්භ වී වසර 27 ක් පමණ ගත වී තිබුණද, සංචාරකයින්ගේ මූලික අවශ්‍යතාවයක් වන පිරිසිදු පානීය ජලය සපයා දීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබූ අතර සනිපාරක්ෂක පහසුකම් ද ගුණාත්මක තත්වයේ නොපැවතුණි.	මින්නේරිය ජාතික උද්‍යානය සඳහා නල ළිඳක් මගින් ජලය ලබාගෙන උපයෝගී කරනු ලබයි. තාක්ෂණයෙන් පිරිපහදු කරනු ලබන ලීටර් 1000 ක ධාරිතාවය ප්‍රමාණවත් නොවන නිසා අධික ධාරිතාවයක් ඇති RO තාක්ෂණයෙන් ජලය පිරිපහදු කරන යන්ත්‍රාගාරයක් 2025 වර්ෂය තුළ සවි කිරීම සැලැස්මට ඇතුළත් කිරීමට යෝජනා කර ඇත.	සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුය.
IV. පරවි දූපත් ජාතික උද්‍යානය		
පරවි දූපත් ජාතික උද්‍යානය වෙත ප්‍රවේශ වීම සඳහා පවතින “A” කවුළුව මුහුදු ඛාදනය මඟින් විනාශ වී තිබූ අතර තාවකාලික කන්ටේනර් පෙට්ටි කොටසක ස්ථාපනය කර තිබූ “B” කවුළුවද විධිමත් පරිදි නඩත්තු නොකිරීම නිසා මළ බැඳී විනාශ වෙමින් පැවතුණි. ප්‍රවේශ පත්‍ර කවුළුවේ වහලය ද කැඩී ගොස් අනතුරුදායක තත්ත්වයක පැවති අතර කිසිදු සනීපාරක්ෂක පහසුකමක් ද නොතිබුණි. එසේම උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගෙන් ප්‍රවේශ පත්‍ර ගාස්තුවක් අය කළද කිසිදු සංචාරක පහසුකමක් සපයා දී නොතිබුණි.	මෙම ප්‍රවේශපත්‍ර කවුළු දෙක පිහිටා ඇති භූමිය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් බැවින් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයට උචිත පරිදි සංවර්ධනය කිරීමට හැකියාවක් නැත. පැරණි ප්‍රවේශපත්‍ර කවුළුව පිහිටි ඉඩම මුහුදු ඛාදනයට ලක්වීම නිසා නව ප්‍රවේශපත්‍ර කවුළුව ඉදි කිරීම සඳහා ඒ ආසන්නයේ ඇති කුච්චවේලි ප්‍රාදේශීය සභාව සතු පර්චස් 04 ක ඉඩමක් බදු පදනම මත ලබාගෙන නව සැලැස්මකට අනුව ඉදිකිරීමට සැලසුම් කර ඇත. ‘‘බී’’ ප්‍රවේශපත්‍ර කවුළුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා	සංචාරකයන් සඳහා අවශ්‍ය අවම පහසුකම් ලබා දීමට කටයුතු කළ යුතුය

		ඇස්තමේන්තු සකස් කිරීමට හා නව ප්‍රවේශපත්‍ර කවුළුව ඉදිකිරීම සඳහා සැලසුම් කර ඇත.	
(ආ)	මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය හේතුවෙන් මින්නේරිය හා කවුඩුල්ල ජලාශ නිරන්තරයෙන් ජලය පිරී තිබීම නිසා වැව් පිටිවල තෘණ ආහාරයට ගැනීමට පැමිණෙන අලි ඇතුන් සඳහා ආහාර ප්‍රමාණවත් නොවීමෙන් වන අලින් ගම් වැදීමෙන් අලි මිනිස් ගැටුම උග්‍රවීම වැලැක්වීම හා සංචාරක කර්මාන්තය රැක ගැනීම වෙනුවෙන් මින්නේරිය සහ කවුඩුල්ල ජලාශවල ජල කළමනාකරණය සම්බන්ධ පාර්ශවයන් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට දෙපාර්තමේන්තුව තීරණය කර තිබුණද, 2024 ඔක්තෝබර් 31 දින වන විටත් එවැනි අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි.	මොරගහකන්ද ජලාශ ව්‍යපෘතිය ජල කළමනාකරණයේ සිදු වූ වෙනස්කම් හේතුවෙන් මින්නේරිය හා කවුඩුල්ල ජලාශයන් අවුරුද්ද පුරාම ජලයෙන් පිරීයාම, තණකොල වැඩීමට බාධාවක් වී ඇත.ඒ හේතුවෙන් වනඅලින් එක්රැස් වීම අඩු වී ඇති අතර මේ තත්ත්වය මඟ හරවා ගැනීමට වගකිවයුතු අනෙකුත් ආයතන සමඟ ඒකාබද්ධව ජලාශවල ජල මට්ටම වන අලින්ට ප්‍රශස්ත ලෙස පවත්වා ගැනීමට කටයුතු කර ඇත. මෙම ගැටලුවට දීර්ඝකාලීන සහ ස්ථිර විසඳුමක් ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පොළොන්නරුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරු පාර්ශවයන් ලෙස ක්‍රියාකරමින් ජල කළමනාකරණය පිළිබඳ අවබෝධතා ගිවිසුමකට එළඹීමට තීරණය කරන ලදී.විරෝධතා හේතුවෙන් උක්ත අවබෝධතා ගිවිසුමට මේ වනවිටත් එළැඹ නොතිබුනත් 2023 වසරවල සිට මින්නේරිය හා කවුඩුල්ල ජලාශවල ජල මට්ටම් පාලනය කර වනඅලින් සඳහා අවශ්‍ය තෘණභූමි පවත්වාගෙන යාම සාර්ථකව සිදු කර ඇත.	අදාල පාර්ශ්ව සමඟ නීත්‍යානුකූලභාවයක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කරගැනීමට කටයුතු කරනු ලබන ආයතනයක් ලෙස එහි ඉලක්ක 10 හා 11 අනුව සැමට සමානාත්මතාවය ඇති කිරීම සඳහා කටයුතු කළ යුතු වුවද ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශ විය හැකි ආකාරයට උද්‍යාන තුළ හා ඉන් පිටත පහසුකම් සලසා නොතිබුණි	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්යාල පරිශ්‍රයන්හි ආබාධ සහිත පුද්ගලයින් වෙත අවශ්‍ය පහසුකම් සපයා දීමට කටයුතු කර ඇත. එහෙත් වනජීවී ජාතික උද්‍යානයන් සඳහා පහසුකම් සැපයීමේදී ස්වභාවික පරිසරය ආරක්ෂා වන අයුරින් කටයුතු කල යුතු බැවින් මතුවන ගැටළු සහගත තත්ත්වයන් මඟ හරවා ගනිමින් ආබාධ සහිත පුද්ගලයින් සඳහා අවශ්‍ය උපරිම පහසුකම් ලබා දීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.	තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කරගැනීමට කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 41 ක් ඇතුලුව දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 1377 ක් විය.ආදායම් උත්පාදනය කරන දෙපාර්තමේන්තුවක් වශයෙන් හා දිවයින පුරා ව්‍යාප්තව පවතින කාර්යාල ජාලයකින් සමන්විත මෙම දොපාර්තමේන්තුවේ කටයුතු වඩා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහාත් කළමනාරකණ තීරණ ගැනීම සඳහාත් ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටිය අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. සහකාර අධ්‍යක්ෂ තනතුරු හා ඉංජිනේරු තනතුර සඳහා සඳහා රාජ්‍ය පරිපාලන ,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම යොමු කර ඇත. පශු වෛද්‍ය තනතුරු 16 සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පුරප්පාඩු සම්බන්ධයෙන් දැනුවත් කර ඇත. සහකාර අධ්‍යක්ෂ තනතුරු 07	ආයතනයේ ඵලදායකත්වය වැඩිකර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය.

තනතුරුවල පවත්නා පුරප්පාඩු අහිතකර ලෙස බලපෑ හැකිව තිබුණි.	සඳහා උසස් කිරීමේ පටිපාටිය අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.